

# ස්වාභාවික උපද්‍රවයන්ගේ වින්දිතයෝ

වත්මන් - මිනිසාගේ අයහපත් චර්යා රටා හේතුවෙන් ස්වාභාවික පරිසරය සමස්ත ලෝකයට සිදුකරන බලපෑම දිනෙන් දින ඉහළ යමින් පවතී. මේ හේතුව නිසාම අතීතයේ පටන් මිනිසා හා පරිසරය සමග පැවති බැඳීම ගිලිහී ගොස් මිනිසාගෙන් පරිසරයට සිදුකරන බලපෑම පරදවා ස්වාභාවික පරිසරය මිනිසාට සිදුකරන තර්ජනය ඉහළ යමින් පවතී. මෙම නිසා අද වන විට ස්වාභාවික ආපදා මිනිසාගේ ජීවන රටාවේ එක් කොටසක් බවට පත් වී ඇත.

ස්වාභාවික ආපදාවක් උපද්‍රවයක් වන්නේ එමඟින් මිනිසාට, දේපළවලට හෝ ස්වාභාවික පරිසරයට හානිකර බලපෑමක් සිදු වූ විට වේ. ලෝකයේ ගංවතුර, නායයෑම්, නියඟ, භූමි කම්පා, ගිනි කඳු පිපිරීම්, සුනාමි, සුළි කුණාටු වැනි ස්වාභාවික උපද්‍රවවලින් සිදුවන ආපදාවන්ට අමතරව මිනිසා විසින් ම නිර්මාණය කරගත් යුද්ධ, ජනවාර්ගික අර්බුද, බෝම්බ පිපිරීම්, අපරාධ, වසංගත රෝග මෙන්ම මාර්ග අනතුරු වැනි උපද්‍රව තුළින් සිදුවන්නා වූ හානි ද වර්තමානයේ සුළු පටු නොවේ.

ලෝකයේ රටවල් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෙස කාණ්ඩ දෙකකට වෙන් කළහොත් මෙම කාණ්ඩ දෙකටම අදාළ රටවල් යට කී කුමන හෝ උපද්‍රවයකට ලක් වී ඇත. නමුත් සංවර්ධිත එසේත් නැත්තම් ආර්ථිකමය අතින් ශක්තිමත් රටවල උපද්‍රවයන්ගෙන් සිදු වන හානිය සංවර්ධනය වෙමින් පවතින

**ස්වාභාවික ආපදාවක් උපද්‍රවයක් වන්නේ එමඟින් මිනිසාට, දේපළවලට හෝ ස්වාභාවික පරිසරයට හානිකර බලපෑමක් සිදු වූ විට වේ.**

රටවලට සිදු වන හානිය තරම් බරපතළ නොවේ. ජපානය, උතුරු ඇමෙරිකාව, මධ්‍යම ඇමෙරිකාව, මැද පෙරදිග ඕස්ට්‍රේලියාව ආදී රටවල ස්වාභාවික උපද්‍රවයන්ගේ බලපෑම ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, චීනය, සූඩානය, පිලිපීනය, ඉන්දුනීසියාව, මාලදිවයින, රුවන්ඩාව, ඉතියෝපියාව, පලස්තීනය ආදී සංවර්ධනය වෙමින් පවතින රටවලට සාපේක්ෂව පහළ මට්ටමේ පවතී. නමුත් යට කී සංවර්ධිත රටවල් ලෝකයේ සිදුවන බොහෝමයක් උපද්‍රවවලට ඍජුව ම මුහුණපාන රටවල් වේ. නිදසුන් ලෙස උතුරු ඇමරිකාවේ ටෙක්සාස් හා ෆ්ලොරිඩා යන ප්‍රදේශ ඉතාමත් ප්‍රබල සුළි කුණාටුවලට නිරතුරුව ම විවෘත වන ප්‍රදේශ වේ. ජපානය ද සුළි කුණාටු, භූමි කම්පා, සුනාමි හා ගිනි කඳු පිපිරීම් වැනි ක්ෂණිකව සිදුවන ඉතාම දරුණු ස්වාභාවික උපද්‍රවයන් නිතර ම වාර්තා කරන රටක් වේ. උපද්‍රවය කොතරම් ප්‍රබල වුවත්, ඒවා නිසා එම රටවල වාර්තා වන ඒවා නිසා එම රටවල වාර්තා වන ජීවිත හානි සංඛ්‍යාව සංවර්ධනය වෙමින් පවතින රටවලට සාපේක්ෂව පහළ මට්ටමක පවතී. නමුත් මෙම රටවල ආර්ථික හානි සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින්නේ බහුතරයක් ආර්ථික කටයුතු ඒකරාශී වී ඇත්තේ වෙරළාශ්‍රිත ප්‍රදේශවල වීම නිසා වේ. මීට අමතරව අධික ගොඩනැගිලි ඝණත්වය හා ඒවා එකිනෙකට ඉතාමත්

ආසන්නයෙන් පිහිටා තිබීම හේතුවෙන් උපද්‍රවයක දී සිදුවන දේපළ හානිය එම නිසා සිදුවන ජීවිත හානිවලට වඩා ප්‍රබල මට්ටමේ පවතී. සංවර්ධිත රටවල් දැඩි ස්වාභාවික ව්‍යසනයකින් පසුව වුවද අළු ගසා දමා නැගී සිටින්නේ එම රටවල් ආර්ථිකමය අතින් ඉතාම ශක්තිමත් රටවල් වීම නිසායි. දිගුකාලීන සහනාධාරවලට වඩා කෙටිකාලීන සහනාධාර මඟින් ඉතාමත් සුළු කාලයක් ඇතුළත සුන්බුන් ඉවත් කර නැවත යථා තත්වයට පැමිණීමේ හැකියාව මෙවැනි රටවලට පවතී.

සංවර්ධිත රටවල් කාර්මීකරණයේ හිණිපෙත්තෙහි පවතින රටවල් වේ. මේ හේතු නිසා ම හදිසි උපද්‍රවයක දී සිදුවන ජීවිත හානි අවමකර ගැනීමට ඔවුන් සතුව පවතින උසස් තාක්ෂණික ඥානය ආශිර්වාදයක් ලෙස යොදා ගනී. හදිසි උපද්‍රවයක් පැමිණීමට පෙර එහි ප්‍රබලත්වය හා එමඟින් හානියට පත්විය හැකි ප්‍රදේශ පිළිබඳ පුරෝකථන පැවසිය හැකි ආකාරයේ තාක්ෂණික මෙවලම් භාවිතය ද, එම උපද්‍රවය නිසා බලපෑමට පත් විය හැකි ජනතාවට අනතුරු ඇඟවීමට හැකි ආකාරයේ දියුණු ක්‍රමවේද පැවතීම නිසා ද එවැනි උපද්‍රවයක දී ආරක්ෂා වීමේ පියවරයන් සම්බන්ධයෙන් ජනතාවගේ ඇති දැනුවත් වීම නිසා ද බොහොමයක් සංවර්ධිත රටවල ස්වාභාවික උපද්‍රවවලින් වාර්තා වන ජීවිත හානි සංඛ්‍යාව පහළ මට්ටමක පවතී. සංවර්ධනය වෙමින් පවතින රටවල තත්ත්වය මේ හා සැසඳීමේ දී පවතින්නේ ඉතාමත් අයහපත් අනතුරු විශාල වශයෙන් ඇති වන කලාප වේ. ගංවතුර හා සුළි කුණාටුවලින් සිදු-වන ආපදාවන්ට අමතර ව නාය යෑම්, සුනාමි, නියඟ, අධික උෂ්ණත්වය, භූමි කම්පා වැනි උපද්‍රව හේතුවෙන් අහිමිවන ජීවිත සංඛ්‍යාව ඉතාම ඉහළ ය. මෑත කාලීන නිදසුන් ලෙස බංගලාදේශයෙන් වාර්තාවන ගංවතුර හා සුළි කුණාටු උපද්‍රවයන්ට ලක්වීමට බලපාන හේතුන් ලෙස එහි පවතින අධික ජන ඝණත්වය, ගංගා, මේඝනා හා බ්‍රහ්මපුත්‍ර යන ප්‍රධාන ගංගාවන්හි ක්‍රියාකාරීත්වය ද, රටෙන් තුනෙන් එකක ප්‍රමාණයක් මුහුදු මට්ටමේ සිට මීටර් අටක් පහළින් පිහිටා තිබීම මෙන් ම විශේෂයෙන්ම රටෙහි පිහිටීම බෙංගාල බොක්ක අඩුපීඩන කලාපයට ඉතාම ආසන්නයේ පිහිටා තිබීම යන සාධක හුවා දැක්විය හැක. හදිසි ගංවතුර තත්වයක දී බංගලාදේශයේ 30% ප්‍රදේශයක් ජලයෙන් යට වේ. 1991 වර්ෂයේ දී පමණක් බංගලාදේශයේ විසිදාහකට අධික මරණ සංඛ්‍යාවක් ගංවතුර හා සුළි කුණාටු නිසා වාර්තා වී ඇත.



ස්වාභාවික සාධකවලට අමතර ව මිනිසා විසින් නිර්මාණය කරගත් සාධක ද යට කී උපද්‍රවයන්ගේ බලපෑම වැඩි කිරීමට හේතු වී තිබේ. බංගලාදේශයේ අධික ගංවතුර තර්ජනයට මූලිකම හේතුව නේපාලය හා හිමාලය ආශ්‍රිතව වනාන්තර ප්‍රදේශ හෙළි පෙහෙළි කිරීමයි. මේ හේතුවෙන් හිමාලය කඳුකරය ආශ්‍රිතව අයිස් තට්ටු දියවීම නිසා ගංගාවන්ගේ පරිමාව මෙන් ම බාදනය ද ඉහළ ගොස් බාදිත ද්‍රව්‍ය පහළ ප්‍රදේශවල තැන්පත් වීමෙන් විශාල ප්‍රදේශයක් ජලයෙන් යට වේ. එමෙන්ම පිටාර තැනි ආශ්‍රිතව පවතින අධික ජන ඝණත්වය හා අයහපත් භූමි පරිභෝජන කටයුතු හේතුවෙන්

ගංවතුරවල බලපෑම ඉහළ ගොස් වාර්තා වන මරණ සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇත. ඉහත සාධක සියල්ලම සැලකීමේ දී බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල ස්වාභාවික උපද්‍රවයන්ගෙන් සිදුවන ජීවිත හා දේපළ හානි උපරිම වීමට එම රටවල පවතින අධික ජන ඝණත්වය, දිළිඳුකම, නොදියුණු තාක්ෂණය, උපද්‍රව පිළිබඳ ජනතාවගේ දැනුවත්බව මඳකම, නීති හා රෙගුලාසිවල ලිහිල් බව ආදී හේතු සාධක බලපා ඇති බව පෙනී යයි. ඒ අනුව පැහැදිලි ං වන්නේ සංවර්ධිත රටවල වාර්තාවන උපද්‍රවයන්ගේ ප්‍රමාණය හා සමාන වුවත් ඒවායින් වැඩිම ජීවිත හා දේපළ හානි ප්‍රමාණයක් වාර්තා වනුයේ සංවර්ධනය වෙමින් පවතින රටවල බවයි. එබැවින් මෙවැනි උපද්‍රවවලින් සිදුවන හානිය අවමකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම බහුතරයක් සංවර්ධනය වෙමින් පවතින රටවල කාලීන අවශ්‍යතාවයකි.

**අනුරාධා විජේරත්න**

# සාර්ථකත්වය රැඳී ඇත්තේ කුමක් මත ද?

අවාසනාව හා කර්මය මත පදනම් ව උත්සාහයේ අගය බාල කරගත් පුද්ගලයන් සමූහයක් ජීවත් වේ. තවත් පිරිසක් පවසන්නේ ඔවුන්ට ජයග්‍රහණයේ හිණිපෙත්තට ම යාමට ධෛර්ය සැපයීමට කිසියම් කෙනෙකු නොසිටි බවයි.

තමාට ජීවිතයේ සාමාර්ථයන් අත්පත් කරගැනීමට නොහැකි වූ විට බොහෝ මිනිසුන් ඊට නිදහසට හේතු සපය යි. තමාගේ දුර්වලතාවයන් වසා ගැනීමේ අරමුණින් නිදහසට හේතු සැපයීම සිදු කරනුයේ බොහෝ මිනිසුන් ආත්ම ගෞරවය රැක ගැනීම සඳහා යැයි පවසයි.

අලස බවින් යුතුව, ක්‍රියාකාරී නොවී ආකල්පමය යහපත් වෙනසක් ඇතිකර නොගෙන නිදහසට හේතු සපයා ආත්ම ගෞරවය බේරා ගැනීමට තැත්කරන පුද්ගලයා අනතුරු සහිත ස්ථානයකින් දියට පනින්නෙකි. නිදහසට හේතු කීම ද පුද්ගල පෞරුෂයේ පවතින අඩුපාඩුවකි.

නොසැලෙන අධිෂ්ඨානය හා ධෛර්ය ඇති, අරමුණක් වෙනුවෙන් අත් නොහරින කැපවීමක් ඇති පුද්ගලයා සැබෑ වාසනාවන්තයා ය. මන්ද යත් ඒ තුළින් ජීවිතයේ ඔබට ඕනෑම සාමාර්ථයක් ලබාගත හැකි ය.

ඔබට මඟ පෙන්වන්නේ වෙනත් කිසිවකු නොව ඔබ ම ය. ඔබ ඔබේ වාසනාව වෙන කෙනෙකුගෙන් ඉල්ලා නොසිටින්න. "තමා හිසට තම අතමය සෙවණැල්ල" යන වදන සිහි කරන්න.

ඔබට ධෛර්ය, නොසැලෙන අධිෂ්ඨානය හා ජයග්‍රහණය දක්වා නොසැලී සිටීමේ හැකියාව නොමැති නම් ඒවා වගා දිගා කර ගන්න. ධෛර්ය හා අධිෂ්ඨානය එක් පුද්ගලයෙකුට පමණක් උරුම වූවක් නොවේ. එය මුළු මහත් ලෝකයේ සෑම පුද්ගලයෙකුට ම ළඟා කර ගත හැක්කකි. අවශ්‍ය වන්නේ ඔබ ඊට හුරු වීම ය. මේ සඳහා ඔබේ මනස ශක්තිමත් කරගත යුතු ය. ශක්තිමත් මනසක් ඇති පුද්ගලයෝ ලෞකික හා අධ්‍යාත්මික යන අංශ දෙකෙහි ම දක්ෂයෝ, නිපුණයෝ බවට පත්වෙති.